**ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය - 2017**

----------------------------------------------------------------------------------------

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ (මණ්ඩලය) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධනය හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනතේ 33 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

-------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 2.2.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14 ඡේදය ප්‍රකාරව, මණ්ඩලය විසින් 2017 දෙසැම්බර් 31 දින වන විටත් කාර්ය පරිපාටි අත්පොතක් පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, මණ්ඩලයේ ප්‍රධාන ආදායම රජයේ ප්‍රදාන වූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු. 9,698,229 කින් එනම් සියයට 10 කින් අඩු වී තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළ දරන ලද පහත සඳහන් පුනරාවර්තන වියදම්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 59 සිට සියයට 104.3 දක්වා වූ පරාසයක සැලකිය යුතු ලෙස වැඩිවී තිබුණි.

| වියදම් වර්ගය | සමස්ථ වියදම | | වැඩිවීම | |
|---|---|---|---|---|
| | 2017 | 2016 | | |
| | රු. | රු. | රු. | ප්‍රතිශතය |
| කුලී හා ගොඩනැගිලි සේවා ගාස්තු | 11,191,842 | 6,234,891 | 4,956,951 | 79.5 |
| සමාලෝචකයින් සඳහා වෘත්තීය ගාස්තු | 1,920,000 | 940,000 | 980,000 | 104.3 |
| විදේශීය ගමන් | 3,994,965 | 2,503,394 | 1,491,571 | 59.6 |

2016 වර්ෂයේදී ධාරිතා සංවර්ධන කටයුතු සඳහා විශේෂ අයවැය ප්‍රතිපාදනයක් ලැබී තිබූ අතර පෙර වර්ෂයේ ලැබී තිබූ එම විශේෂ අයවැය ප්‍රතිපාදනය යොදා ගනිමින් වෘත්තීය ගාස්තු වලින් කොටසක් ගෙවා තිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

-------------------------------

**4.1** **කාර්යසාධනය**

-------------------

1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත අනුව මණ්ඩලයේ කර්තව්‍යය වන්නේ, නිශ්චිත ව්‍යාපාර ආයතන මගින් ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිතිවලට අනුකූලව ක්‍රියාකරන බවට අධීක්ෂණය කිරීමයි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රට තුළ පවතින නිශ්චිත ව්‍යාපාර ආයතන ප්‍රමාණය හඳුනා ගැනීමට 2018 මාර්තු 31 දින වන විටත් මණ්ඩලය අපොහොසත් වී තිබුණි. තවද, මණ්ඩලය විසින් මේ සඳහා උචිත යාන්ත්‍රණයක් හඳුන්වාදී හෝ ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) විගණනය සඳහා ඉදිරිපත් කළ තොරතුරු අනුව, නිශ්චිත ව්‍යාපාර ආයතන විසින් ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිතිවලට අනුකූලව ක්‍රියාකරන බවට තහවුරු කිරීම සඳහා මණ්ඩලය විසින් 2017 වර්ෂය තුළදී මූල්‍ය ප්‍රකාශන 518 ක් පමණක් සමාලෝචනය කර තිබූ අතර, එහි 2015 හා ඊට පෙර වර්ෂ හා 2016 සහ 2017 වර්ෂවලට අදාලව ලැබී තිබුණු මූල්‍ය ප්‍රකාශන අන්තර්ගත විය.

(ඇ) මණ්ඩලය විසින් සමහර නිශ්චිත ව්‍යාපාර ආයතන සමග ඒ වනවිටත් සන්නිවේදනය කර තිබූ සොයාගැනීම් සම්බන්ධව පසුවිපරම් කටයුතු සිදු කර නොතිබුණි.

**4.2** **කළමනාකරණ ක්‍රියාකාරකම්**

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් දැනට සිටින ගොඩනැගිල්ලේ පළමු මහල කුලී පදනම මත ලබා ගැනීම සඳහා සිලෝන් බයිබල් හවුස් සමඟ 2017 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වර්ෂ 04 ක් සඳහා ගිවිසුම් ගත වී තිබුණි. කෙසේ වුවද, අපේක්ෂිත අරමුණ සඳහා මුළු බිම් ප්‍රමාණය යොදා ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබූ බව නිරීක්ෂණය වූ අතර ඒ වෙනුවට මණ්ඩලයේ අනෙකුත් තාවකාලික කටයුතු සඳහා මෙම බිම් ප්‍රමාණය 2018 මාර්තු 31 දින වන තෙක් යොදා ගෙන තිබුණි. එමනිසා, සමාලෝචිත වර්ෂයේදී මේ සඳහා දරා තිබූ රු. 5,695,341 ක මුදල අනාර්ථික වියදමක් විය.

(ආ) මණ්ඩලය සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් අධ්‍යයනය, සැලසුම් කිරීම, සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනයෙන් රු. 1,575,000 ක් වටිනා ලැප්ටොප් පරිගණක 15 ක් සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලය වෙත ලබා දී තිබුණි. (මණ්ඩලය හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණි). කෙසේ වුවද, මණ්ඩලය විසින් ඉදිරිපත් කළ පැහැදිලි කිරීම් අනුව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනයේ වූ අයවැය බාධක හේතුවෙන් පද්ධතියේ සංවර්ධන හා ක්‍රියාත්මක කිරීම් සම්පූර්ණ කර නොතිබුණි.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලයට අයත් ඉහළ කළමනාකරණ මට්ටමේ තනතුරු 03 ක්, ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරක් හා තෘතියික මට්ටමේ තනතුරු 02 ක් සඳහා 2009 වර්ෂයේ සිට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් සිදුකර තිබූ අතර ඉහළ කළමනාකරණ මට්ටමේ තනතුරු 03 සඳහා නිත්‍ය තනතුරුවලට අනුමත පාරිශ්‍රමිකවලට වඩා ඉහල ප්‍රතිලාභ එම තනතුරු දරන්නන් සඳහා ගෙවනු ලබන බවත් නිරීක්ෂණය විය.

(ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3 ඡේදය ප්‍රකාරව, අනුප්‍රාප්තික සැලසුමක් මණ්ඩලය විසින් පිළියෙල කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---------------------------------------------

## 5.1 අයවැයමය පාලනය

-------------------------

සමාලෝචිත වර්ෂයේ අයවැයගත සහ සත්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය සඵලදායී කළමනාකරණ පාලන උපකරණයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 5.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

---------------------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛය ප්‍රකාරව, කාර්තුමය පදනමින් ළඟාකර ගැනීමට අපේක්ෂිත ඉලක්ක හා එම ඉලක්ක සඳහා වගකිව යුතු නිලධාරීන් ඇතුළත් කරමින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් මණ්ඩලය විසින් පිළියෙල කර නොතිබුණි.